# මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය
# (2017 ඔක්තෝබර් 01 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා)

2017 ඔක්තෝබර් 01 දින සිට 2017 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් මෙම වාර්තාවෙන් ආවරණය කෙරේ.

## 01. 2018 වර්ෂය සඳහා නිර්දේශ

2018 වර්ෂයේ දී ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා අරමුදල් බෙදා වෙන් කිරීම සඳහා වන මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ 2018 නොවැම්බර් 06 වන දින පාර්ලිමේන්තුව වෙත භාෂා තුනෙන්ම ඉදිරිපත් කරන ලදී. (13 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ජ) වගන්තිය අනුව)

එහි ඇතුළත් ප්‍රධාන නිර්දේශ වන්නේ,

- කොමිෂන් සභාවේ කාර්යභාරය අර්ථවත් ලෙස ඉටු කිරීම සඳහා පළාත්වලට වෙන් වන මුළු ප්‍රතිපාදන ප්‍රමාණය සලකා බැලීම වැදගත් වේ. වර්තමාන ක්‍රමය යටතේ පළාත්වලට වෙන් වන මුළු ප්‍රතිපාදන තීරණය කිරීම අපහසු වී ඇති බැවින්, සැලසුම් කිරීමේ අදියරේ සිට මෙහෙයුම්කරණය හා ගිණුම්කරණය දක්වා වන ක්‍රියාවලිය විමර්ශනයට ලක් කිරීමට යෝජනා කර ඇත.
- විමධ්‍යගත විෂයයන් යටතට ගැනෙන අංශ සංවර්ධනය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන පළාත් සභා හරහා ලබා දීම නිර්දේශ කෙරේ. රේඛීය අමාත්‍යාංශ මගින් හඳුනාගන්නා ලද විමධ්‍යගත විෂයන් යටතට ගැනෙන ව්‍යාපෘති ඇතොත් ඒවා පළාත් සභා හරහා ක්‍රියාත්මක කළ යුතු වේ.
- බලය බෙදීමේ සංකල්පයට හානියක් නොවන පරිදි ජාතික සහ උප ජාතික සැලසුම්කරණය සඳහා පොදු රාමුවක් ස්ථාපිත කිරීම.
- පළාත් සභා තුළ මානව සම්පත් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.
- දැනට භාවිතයට නොගන්නා ආදායම් ප්‍රභවයන් මගින් පළාත් ආදායම් වැඩි කිරීම.
- පළාත්වල තරුණයින්ගේ නිපුණතා සංවර්ධනය කිරීම.
- තෝරාගත් ප්‍රදේශවල පුද්ගලික ආයෝජන සඳහා විශේෂ දිරිගැන්වීම් ලබාදීම.

මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා අඩු ප්‍රතිපාදන ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති අතර, මේ පිළිබඳව මුදල් කොමිෂන් සභාව විසින් පසු විපරම් කරමින් සිටී.

## 02. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සංශෝධනය - 2017

පළාත් විසින් කරන ලද ඉල්ලීම් මත පදනම්ව, 2017 වාර්ෂික සංවර්ධන සැලසුම්වල පුළුල් ක්‍රියාකාරකම් පරාසය දක්වා සංශෝධනයන් පළාත් විසින් සිදු කර ගැනීමට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවය ප්‍රදානය කරන ලදී.

## 03. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2016

ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ අනුවාදයන් සහිත 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීම සඳහා 2017 දෙසැම්බර් 05 වෙනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇත.

**04. 2018 වර්ෂය සඳහා පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම පිළිබඳ මාර්ගෝපදේශයන් යැවීම**

2018 වර්ෂය සඳහා පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ පළාත් වෙත යවා ඇත.

**05. උපාය මාර්ගික සැලැස්ම නැවත සමාලෝචනය කිරීම.**

මුදල් කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්ම සමාලෝචනය කර යාවත්කාලීන කර ඇත.

**06. පළාත් විගණන වාර්තා පිළිබඳ වාර්තා සැකසීම**

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද නැගෙනහිර, උතුරු මැද හා බස්නාහිර පළාත්වල විගණන වාර්තාවන්හි විශේෂිත කරුණු පළාත්වල වගවීම වැඩිදියුණු කිරීමේ අරමුණින් අදාල පළාත්වල ප්‍රධාන ලේකම්වරුන් සහ ආණ්ඩුකාරවරුන් වෙත යොමු කරන ලදී.

**07. මුදල් කොමිෂන් සභාව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

මුදල් කොමිෂන් සභාවේ පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. මුදල් කොමිෂන් සභාවේ දී ප්‍රගති සමාලෝචන රැස්වීම් තුනක් පවත්වන ලද අතර, ව්‍යාපෘති උපදේශක ඒකකය (මොරටුව විශ්වවිද්‍යාලයේ ගෘහ නිර්මාණ පීඨය) හා කොන්ත්‍රාත්කරුගේ සහභාගිත්වයෙන් තවත් තාක්ෂණික රැස්වීම් තුනක් පවත්වන ලදී. අනුමත මුදල වන රු.මි. 300 න් දෙසැම්බර් 31 වන විට වියදම රු.මි. 134 කි. මෙම ව්‍යාපෘතිය දින 109 ක ප්‍රමාදයක් වාර්තා කර ඇත. ව්‍යාපෘතිය අවසන් කළ යුතු දිනය වන 2018 පෙබරවාරි මස 28 වන දින ව්‍යාපෘතිය අවසන් කිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙනු ලැබිය. මෙම දිගු ප්‍රමාදය හේතුවෙන් කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේ සිට සතිපතා රැස්වීම් වැඩබිම තුළ සංවිධානය කිරීමට සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව වැඩි කිරීමට ව්‍යාපෘති උපදේශක ඒකකයෙන් ඉල්ලා ඇත.



*පින්තූරය: මුදල් කොමිෂන් සභාවේ පරිපාලන ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු*

### 08. මුදල් කොමිෂන් සභා දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS/DB)

කොමිෂන් සභාවේ කාර්යභාරය හා එම කාර්යභාරය ඉටු කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව සඳහා දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය ඉතා වැදගත් වේ. 2017 අප්‍රේල් මාසයේදී මේ සම්බන්ධයෙන් කොමිසම විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමග සාකච්ඡා කළ අතර, එහි සභාපතිවරයා වෙත ලිපියක් යොමු කරන ලදී. මෙම ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා මුදල් කොමිෂන් සභාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය අතර රැස්වීම් වාර ගණනාවක් පවත්වා ඇත. කෙසේ වෙතත්, ICTA ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් අර්ථවත් ප්‍රතිඵල ලබා ගත නොහැකි විය. ඒ අනුව ආසියානු පදනමෙන් අරමුදල් ලබාගත යුතු බව කොමිසම තීරණය කර ඇති අතර, යෝජිත MIS/DB සඳහා සහයෝගය ලබාගැනීමට මුදල් කොමිෂන් සභාව විසින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) සමග සාකච්ඡා ආරම්භ කර ඇත. කෙසේ වෙතත් ICTA ආයතනය විසින්, පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා උපදෙස් ලබාදීමක් ඉදිරියේදී සිදු කරනු ලබයි.

### 09. මුදල් කොමිෂන් සභා පනතේ කෙටුම්පත

මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත අතිගරු ජනාධිපතිතුමාට 2016.11.09 දින යොමු කරන ලදී. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් කෙටුම්පත සම්බන්ධයෙන් යම් නිරීක්ෂණයන් ඉදිරිපත් කළ අතර, මුදල් කොමිසම ඊට ප්‍රතිචාර දක්වා ඇත. අදාල පනත සකස් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2017 දෙසැම්බර් 15 දින කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බව මුදල් කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.

### 10. අධ්‍යයන චාරිකා

මුදල් කොමිෂන් සභාවේ ලේකම් සහ අනෙකුත් අදාල කාර්ය මණ්ඩලය 2017.11.07 දින කැස්බෑව නගර සභාවෙහි අධ්‍යන චාරිකාවක නිරත විය. මෙම සංචාරයේ අරමුණ වූයේ නගර සභා ව්‍යුහය, රාජකාරි හා වගකීම්, ආදායම් හා වියදම් වර්ගීකරණය, ආදායම් එකතු කිරීම, සංවර්ධන ව්‍යාපෘති, පුස්තකාල කළමනාකරණය, යටිතල පහසුකම් නඩත්තු කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය, පෙර පාසැල් අධ්‍යාපනය, සුභසාධන කටයුතු, ඉතිරි කිරීම් හා ආයෝජන සහ සේවක කළමනාකරණය පිළිබඳව සොයා බැලීමය.



*පින්තූර: කැස්බෑව නගර සභාව*

## 11. කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය

### 11.1. පුහුණු කිරීම්

මුදල් කොමිෂන් සභාවේ කාර්යමණ්ඩල නිලධාරීන් කිහිප දෙනෙකුට පහත සඳහන් තෝරාගත් ක්ෂේත්‍රයන්හි පුහුණු අවස්ථා ලබා දී ඇත.

- ඵලදායි කළමනාකාරිත්ව කුසලතා
- ව්‍යාපෘති යෝජනා සකස් කිරීම
- රාජ්‍ය ඩිජිටල්කරණය
- සයිබර් ආරක්ෂණ සහ ආචාරධර්ම
- ව්‍යාපෘති කළමනාකරණය
- යතුරුලියනය සහ ඩෙස්ක්ටොප් ප්‍රකාශනය

### 11.2. ආරාධිත දේශන

විවෘත විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහීම් මෙන්ඩිස් මහතා විසින් මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා "මුදල් කොමිෂන් සභාව සඳහා යහපාලනය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

### 11.3. කාර්යමණ්ඩල අධ්‍යයන

මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් පහත දැක්වෙන අධ්‍යයනයන් ඉදිරිපත් කරන ලදී.

| නම | මාතෘකාව |
|---|---|
| • තිලෝකා අබේසේකර මහත්මිය, සහකාර අධ්‍යක්ෂ | නැගෙනහිර පළාත් සංවර්ධන සැලැස්ම සමාලෝචනය |
| • ටී.කේ. පුෂ්පසිරි මහතා, තොරතුරු තාක්ෂණ නිලධාරී | කෘතිම බුද්ධිය, දත්ත විශ්ලේෂණය |
| • නිමාලි රත්නායක මහත්මිය, සංඛ්‍යා ලේඛන නිලධාරී | සංවර්ධනය පිළිබඳ අවකාශීය අසමානතාව, දරිද්‍රතා දර්ශකය 2016 - 2017 |

### 11.4. ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන සඳහා නව ජාතික දේශගුණික මූල්‍ය යාන්ත්‍රණ පිළිබඳ දෙවන ජාතික වැඩමුළුව

ආසියානු හා පැසිෆික් කලාපීය ආර්ථික හා සමාජීය කොමිසම (UNESCAP) සහ පරිසර හා සංවර්ධන කේන්ද්‍රය යන ආයතනයන්ගේ සංවිධානයෙන් 2017 නොවැම්බර් මස 07 සහ 08 වන දින මහ බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ දී වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා සම්පත් දායකයකු ලෙස සභාපතිවරයා සහභාගී විය.

**11.5.** **රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම පිළිබඳ වැඩමුළුව**

ජාත්‍යන්තර සංවර්ධනය සඳහා එක්සත් ජනපද නියෝජිතායතනය (USAID), මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් මස 28 සහ 29 යන දිනවල දී මෙම වැඩමුළුව හිල්ටන් හෝටලයේ දී පවත්වන ලදී. මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ නිලධාරීන් දෙදෙනෙක් වැඩමුළුවට සහභාගී වූහ. ජාතික හා උප ජාතික වශයෙන් රාජ්‍ය පෞද්ගලික ධාරිතාව අඛණ්ඩව ඉහළ නැංවීමේ ප්‍රයත්නයන්හි තිරසාරත්වය තහවුරු කිරීම සඳහා මෙම පුහුණු වැඩමුළුව පවත්වන ලදී.

**11.6.** **පළාත් සහ දිස්ත්‍රික් සැලසුම්කරුවන් සඳහා තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ පුහුණු වැඩමුළුව**

තිරසාර සංවර්ධනය හා වනජීවි අමාත්‍යාංශය විසින් 2017 ඔක්තෝබර් මස 20, 21 යන දිනයන්හි දී සහ 2017 නොවැම්බර් මස 09, 10, 11 දිනවල දී මීගමුව ජෙට්වින්ග් බ්ලූ සහ හෙරිටර්ස් හෝටල් හිදී පුහුණු වැඩමුළු පවත්වන ලදී. මුදල් කොමිෂන් සභාවේ ලේකම් සහ නිලධාරීන් දෙදෙනෙකු මෙම වැඩමුළුවට සහභාගී වූහ.

**11.7.** **"ශ්‍රී ලංකා ආර්ථිකය" අනාගත ප්‍රතිපත්ති සඳහා මගපෙන්වීම පිළිබඳ සම්මන්ත්‍රණය**

ශ්‍රී ලංකා ආර්ථික සංගමය විසින් සංවිධානය කරන ලද මෙම සම්මන්ත්‍රණය 2017 දෙසැම්බර් මස 11 වන දින ශ්‍රී ලංකා වෘත්තීය සංගමයේ ශ්‍රවනාගාරයේ දී පවත්වන ලදී. මුදල් කොමිෂන් සභාවේ සභාපති මෙම සම්මන්ත්‍රණයට සහභාගි විය.

**11.8.** **ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ආදායම් උත්පාදනය කිරීම පිළිබඳ ඉදිරිපත් කිරීම**

ආසියානු පදනමේ විධායක අධ්‍යක්ෂ සුභාකරන් අරුමෛතුරෙයි මහතා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ආදායම් උත්පාදනය ඉහළ නැංවීම පිළිබඳ ඉදිරිපත් කිරීමක් 2017 ඔක්තෝබර් මස 31 වන දින මුදල් කොමිෂන් සභාව සඳහා ඉදිරිපත් කරන ලදී.

**12.** **බස්නාහිර පළාතේ කෘෂිකර්ම, වාරිමාර්ග හා පශු සම්පත් යන අංශවලට අදාල කරුණු පිළිබඳ රැස්වීම**

මෙම රැස්වීම පළාත් කෘෂිකර්ම, පශු සම්පත් හා වාරිමාර්ග යන දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂවරුන් සමග 2017 ඔක්තෝබර් මස 03 වන දින මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.

රැස්වීමේ ප්‍රධාන අරමුණ වූයේ පළාත් කාර්යමණ්ඩලයට පළාත් මට්ටමේ පවතින ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට හා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීමයි.

**13.** **අයවැය වෙන් කිරීම, මාර්ගෝපදේශ හා 2018 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳ රැස්වීම**

අයවැය වෙන් කිරීම, මාර්ගෝපදේශ හා 2018 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳව සංවිධානය කරන ලද විශේෂ රැස්වීම් දෙකක් 2017 ඔක්තෝබර් මස 20 හා 2017 නොවැම්බර්

මස 21 යන දිනවල මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී. සියලුම පළාත්වල ප්‍රධාන ලේකම්වරුන් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) මෙම රැස්වීමට සහභාගි විය.

## 14. පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමග රැස්වීම

මෙම රැස්වීම පළාත් කෘෂිකර්ම, පශු සම්පත්, අධ්‍යාපන, පරිවාස හා ළමාරක්ෂක, බටහිර වෛද්‍ය, දේශීය වෛද්‍ය, වාරිමාර්ග හා පළාත් මාර්ග යන දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂවරුන් / කොමසාරිස්වරුන් සමග 2017 දෙසැම්බර් මස 05 හා 08 යන දිනවල මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.



රැස්වීමේ ප්‍රධාන අරමුණ වුයේ, 2018 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම් සකස් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පළාත් කාර්යමණ්ඩලයට අවස්ථාවක් ලබාදීමයි.

## 15. පළාත් කාර්යමණ්ඩල තනතුරු ඇති කිරීම හා පුරප්පාඩු පිරවීම පිළිබඳ සාකච්ඡාව

මුදල් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද සාකච්ඡාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමග 2017 දෙසැම්බර් මස 20 වන දින මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී. සාකච්ඡාවේ ප්‍රධාන අරමුණ වුයේ, පළාත් කාර්යමණ්ඩලය නිර්දේශ කිරීමේ දී හා අනුමත කිරීමේ දී එක් එක් ආයතනවල කාර්යභාරය පැහැදිලි කරගැනීම හා පළාත් කාර්යමණ්ඩල කළමනාකරණය පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණ ගැනීමයි.

## 16. ස්වාධීන කොමිෂන් සභා කාර්යභාරය පිළිබඳව සම්මන්ත්‍රණය

මෙම රැස්වීම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් කොමිෂන් සභා නියෝජිතයින් සමග 2017 ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලදී. මේ සඳහා මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනෙකු සමග සභාපති සහභාගි විය.

මෙම සම්මේලනයේ පරමාර්ථය වුයේ කොමිෂන් සභාවල ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සියලු නියෝජිතයින්ට අවස්ථාවක් ලබාදීම සහ ව්‍යවස්ථාදායක සභාවට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමයි.

## 17. ව්‍යවස්ථා සභාව සමග රැස්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති ගරු කරු ජයසූරිය මහතාගේ ආරාධනයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සමග රැස්වීමක් පවත්වන ලදී. කාර්යක්ෂම කාර්යමණ්ඩලයක හිඟකම හේතුවෙන් ස්වාධීන කොමිෂන් සභා කාර්යසාධනයට බාධා ඇතිවී ඇති අතර, කොමිෂන් සභා විසින් මේ සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතු බව රැස්වීමේ දී තීරණය විය. එම තීරණය අනුව මුදල් කොමිෂන් සභාව විසින් "ස්වාධීන කොමිෂන් සභා සඳහා වෙනම කාර්යමණ්ඩල ව්‍යුහයක්" පිළිබඳව ලිපියක් පාර්ලිමේන්තු මහ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. නව කාර්යමණ්ඩල අවශ්‍යතාවය (කොන්ත්‍රාත් පදනම මත විශේෂඥයින් සහිත) හඳුනාගනිමින් පවතී.

## 18. ජාතික සෞඛ්‍ය සංවර්ධන කමිටු රැස්වීම

2017 දෙසැම්බර් 15 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ලැවෙන්ඩර් ශාලාවේ පැවති ජාතික සෞඛ්‍ය සංවර්ධන කමිටු රැස්වීමට මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා සහභාගි වූහ. මුදල් කොමිෂන් සභාව මෙම කමිටුවේ සාමාජිකයෙකි. මෙම රැස්වීම තුළ දී පහත දැක්වෙන කරුණු ද ඇතුළත්ව අදාල ගැටළු රාශියක් සාකච්ඡාවට බඳුන් විය.

- ප්‍රාථමික සෞඛ්‍ය සේවාව ශක්තිමත් කිරීම හා ජාතික සෞඛ්‍ය සේවා සැපයුම් පද්ධතිය ශක්තිමත් කිරීම.
- නිදන්ගත වකුගඩු රෝගය වැළැක්වීම සඳහා බහු උපායමාර්ග ඉස්මතු කිරීම.
- ජීවන කුසලතා ප්‍රවේශය යටතේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය මගින් බෝ නොවන රෝග පිළිබඳ ගැටළුවට පිළියම් යෙදීම හා සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ඇති කිරීම අවධාරණය කිරීම.
- මැලේරියාව නැවත හිස එසවීම.

## 19. අභ්‍යන්තර විගණන කමිටුව

අභ්‍යන්තර විගණන කමිටුවේ 03 වන රැස්වීම විගණන අධිකාරිවරයා සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකුගේ සහභාගිත්වය සහිතව පවත්වන ලදී. අවශ්‍ය පසු විපරම් ක්‍රියා මාර්ග ගැනීම සඳහා රැස්වීමේදී ගනු ලැබූ තීරණයන් මුදල් කොමිෂන් සභාවේ සියලු කාර්යමණ්ඩලය වෙත දන්වන ලදී. අභ්‍යන්තර විගණනය, අදාල කටයුතු විධිමත් කිරීමට අමතරව කාර්යසාධනය උදෙසා විය යුතු බව කොමිෂන් සභාව තීරණය කරන ලදී.

## 20. ජාතික හා පළාත් මට්ටමේ මනා සම්බන්ධීකරණය තුළින් සංවර්ධන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩමුළුවට අදාල පසු විපරම් කිරීම

2015 ජුනි මස 15 වැනි දින පවත්වන ලද මෙම වැඩමුළුවේ තීරණ හා නිර්දේශ පසු විපරම් කිරීමට, එහිදී හඳුනාගත් ගැටළු සහ නිර්දේශ මත පදනම් වූ පිරික්සුම් ලැයිස්තුවක් සකස් කරන ලදී. එම පිරික්සුම් ලැයිස්තුව, ක්‍රියාකාරකම් සැලසුම සමග ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද අතර, ජනාධිපති ලේකම් විසින් එම වැඩමුළුවේ දී ඉදිරිපත් වූ නිර්දේශ පිළිබඳ ප්‍රගතිය විමර්ශනය කිරීමට 2017 සැප්තැම්බර් මස 15 වැනි දින රැස්වීමක් කැඳවීය. අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම රැස්වීමට සහභාගි වූහ. ජනාධිපති කාර්යාලය විසින් කරන ලද ඉල්ලීම අනුව, මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රගතිය සමාලෝචනය සිදු කරන ලදී.

## 21. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව

2017 දෙවන කාර්තුවේ හා තුන්වන කාර්තුවේ මුදල් කොමිෂන් සභා කාර්යසාධන වාර්තා 2017 නොවැම්බර් මස 07 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

## 22. පාලන සංග්‍රහයක් / Code of Governance

මුදල් කොමිෂන් සභාව සඳහා පාලන සංග්‍රහයක් දෙසැම්බර් මස 28 වන දා පැවති කොමිෂන් සභා රැස්වීමේ දී සම්මත කරන ලදී. මෙය විනිවිදභාවය, වගවීම සහ කාර්යසාධනය වැඩිදියුණු කරනු ඇත.

## 23. විශේෂ අධ්‍යයනයන්

මුදල් කොමිෂන් සභාවේ කටයුතු සඳහා සහාය දැක්වීමට විශේෂ අධ්‍යයන ගණනාවක් සිදු කරන ලදී. පහත දැක්වෙන මාතෘකා යටතේ එම අධ්‍යයනයන් සිදු කර ඇත.

- ශ්‍රී ලංකාවේ අන්තර් රාජ්‍ය මූල්‍ය සම්බන්ධතා
- මාර්ග නඩත්තු වියදම් හා පිරිවැය නැවත අය කිරීම සඳහා වූ යෝජනාව
- කාර්යමණ්ඩලය හා පළාත් සභා, පළාත් අධිකාරි සහ පළාත් පාලන අධිකාරි
- තුලිත ප්‍රාදේශීය සංවර්ධනය

## 24. කොමිෂන් සභා රැස්වීම් / විධායක නිලධාරීන්ගේ රැස්වීම් / කාර්යමණ්ඩල රැස්වීම්

- කොමිෂන් සභා රැස්වීම් හතරක් පහත දිනයන්හි පවත්වන ලදී.

    - 2017 ඔක්තෝම්බර් 31
    - 2017 නොවැම්බර් 24
    - 2017 දෙසැම්බර් 07
    - 2017 දෙසැම්බර් 28

- සෑම කොමිෂන් සභා රැස්වීමක්ම පැවැත්වීමට පෙර උප කමිටුව රැස්වෙන ලදී.
- විධායක නිලධාරීන්ගේ රැස්වීම් - සතිපතා විධායක නිලධාරීන්ගේ රැස්වීම් අඛණ්ඩව පවත්වන ලදී.
- කාර්යමණ්ඩල රැස්වීම් - 2017 ඔක්තෝම්බර් 31 හා 2017 දෙසැම්බර් 29 යන දිනවල පවත්වන ලදී.